සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA1 විභාගය - 2019 ජනවාරි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

(Economics for Business and Accounting)

2019-02-02
පස්වරු
[1.45 – 5.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) ***ප්‍රස්තාර කොළ** සපයනු ලැබේ.*

(7) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(8) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, ආර්ථික විද්‍යාවේ "හිඟකම" යන්න නිවැරදිව විස්තර කරනු ලබන ප්‍රකාශනය තෝරන්න:

(1) හිඟකම යනු නිශ්චිත තීරණයක් තෝරා ගැනීමේදී කැපකළ ඊළඟ හොඳම විකල්ප තෝරාගැනීමේ වටිනාකමයි.

(2) හිඟකම යනු භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය කිරීමට සම්පත්වල ඇති විකල්ප භාවිතයයි.

(3) හිඟකම යනු පරිභෝජනය කළ භාණ්ඩයක අමතර ඒකකයකින් මුළු උපයෝගිතාවට වන එකතු කිරීමයි.

(4) හිඟකම යනු මානව අවශ්‍යතා සහ අසීමිත මානව වුවමනාවලට අදාළව සම්පත්වල පවත්නා සීමිත භාවයයි.

**1.2** $x$ සහ $y$ භාණ්ඩ අතර හරස් ඉල්ලුම් නම්‍යතාවය ධන වන්නේ නම්, එම භාණ්ඩ:

(1) අනුපූරක භාණ්ඩ වේ. (2) ආදේශක භාණ්ඩ වේ.

(3) සාමාන්‍ය භාණ්ඩ වේ. (4) බාල භාණ්ඩ වේ.

1.3 පූර්ණ තරගයේ ලක්ෂණ සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශන ඔබ වෙත දී ඇත:

(a) එහි ව්‍යාපාරික ආයතන විශාල සංඛ්‍යාවක් තිබේ.

(b) එහි සමජාතීය නිෂ්පාදිත විකුණනු ලබයි.

(c) එහි දිගුකාලීනව (long run) ප්‍රමාණික ලාභ පමණක් උපයයි.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, පූර්ණ තරගයේ ලක්ෂණ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශන වන්නේ:

(1) (a) සහ (c) පමණි. (2) (a) සහ (b) පමණි.

(3) (b) සහ (c) පමණි. (4) ඉහත සඳහන් සියල්ලම.

1.4 ආයතනයක එහි ලාභය උපරිම වන්නේ:

(1) සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා මිල අඩුවන විටය.

(2) මුළු පිරිවැය, ආන්තික පිරිවැයට සමානවන විටය.

(3) මුළු පිරිවැය, මුළු ආදායමට සමාන වන විටය.

(4) ආන්තික පිරිවැය, ආන්තික ආදායමට සමාන වන විටය.

1.5 සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් තිබෙන භාණ්ඩයක් මත ඒකක බද්දක් පැනවීමෙන්:

(1) මුළු බදු බර පාරිභෝගිකයා විසින් දරනු ලැබීමට මඟ පැදෙයි.

(2) බදු බරෙන් විශාල කොටසක් පාරිභෝගිකයා විසින් දරනු ලැබීමට මඟ පැදෙයි.

(3) බදු බරෙන් කුඩා කොටසක් පාරිභෝගිකයා විසින් දරනු ලැබීමට මඟ පැදෙයි.

(4) බදු බරෙන් හරියටම අඩක ප්‍රමාණයක් පාරිභෝගිකයා විසින් දරනු ලැබීමට මඟ පැදෙයි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, රජයේ සාර්ව ආර්ථික අරමුණක් වන්නේ කුමක් ද?

(1) සමාහාර පරිභෝජනය. (2) විනිමය අනුපාතිකය.

(3) ගෙවුම් ශේෂ සමතුලිතතාවය. (4) සේවා වියුක්තිය.

1.7 පහත සඳහන් ඒවා අතුරෙන්, වෙළෙඳපොළ (ධනවාදී) ආර්ථිකයක නිවැරදි ලක්ෂණයක් තෝරන්න:

(1) පාරිභෝගිකයන්ට ස්වාධිපත්‍යයක් (නිදහස) නොමැත.

(2) ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යගත සැලසුම්කරණ කමිටුවක් මගින් මෙහෙයවනු ලැබේ.

(3) නිෂ්පාදනය සහ බෙදාහැරීම රජය මගින් ඉටුකරනු ලැබේ.

(4) නිෂ්පාදකයන්ට ස්වාධිපත්‍යයක් (නිදහස) තිබේ.

1.8 සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ අවම ලක්ෂ්‍යයේදී:

(1) සාමාන්‍ය මුළු පිරිවැය, ආන්තික පිරිවැයට සමාන වේ.

(2) සාමාන්‍ය ස්ථාවර පිරිවැය, ආන්තික පිරිවැයට සමාන වේ.

(3) මුළු පිරිවැය, සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන වේ.

(4) මුළු පිරිවැය, ආන්තික ආදායමට සමාන වේ.

**1.9** 2017 වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම වූයේ:

(1) ඇමරිකානු ඩොලර් ($) 4,200 කි. (2) ඇමරිකානු ඩොලර් ($) 3,924 කි.

(3) ඇමරිකානු ඩොලර් ($) 3,700 කි. (4) ඇමරිකානු ඩොලර් ($) 4,065 කි.

**1.10** ගෙවුම් ශේෂ ලේඛනයේ වෙළෙඳ ගිණුමේ ධනාත්මක ශේෂයෙන් පෙන්නුම් කරන්නේ:

(1) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට වඩා වැඩි බවයි.

(2) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට වඩා අඩු බවයි.

(3) අපනයනය කරන ලද භාණ්ඩවල වටිනාකම, ආනයනය කරන ලද භාණ්ඩවල වටිනාකමට සමාන බවයි.

(4) අපනයන මිල දර්ශකය, ආනයන මිල දර්ශකයට වඩා අඩු බවයි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** උපේක්ෂා වක්‍රයකින් ආයතනයක මුළු පිරිවැය සහ ආන්තික පිරිවැය අතර ඇති සම්බන්ධතාවය විස්තර කරයි.

**1.12** ආදායම් ප්‍රතිවිපාකය, ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම්වීම සඳහා හේතුවකි.

**1.13** භාණ්ඩයක ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වෙනස, එම භාණ්ඩයේ මිලෙහි වෙනසට සමාන වේ නම්, මිල ඉල්ලුම් නම්‍යතාවය එකට වඩා වැඩි වේ.

**1.14** නිෂ්පාදකයාගේ අතිරික්තය යනු භාණ්ඩයේ සමතුලිත මිල සහ නිෂ්පාදක විසින් එය විකිණීමට කැමති මිල අතර වෙනස වේ.

**1.15** සම්පත් හි පූර්ණ සේවා නියුක්තිය, නිෂ්පාදන හැකියා වක්‍රයෙහි [Production Possibility Curve (PPC)] පවත්නා උපකල්පනයකි.

*අංක 1.16 සිට 1.20 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ දී ඇති උත්තර දෙක අතුරින් නිවැරදි උත්තරය තෝරාගන්න. තෝරාගත් උත්තරය ප්‍රශ්න අංකය සමග, උත්තර පොතේ ලියන්න.*

**1.16** …………………… *(මිශ්‍ර ආර්ථිකයක / සැලසුම්ගත ආර්ථිකයක)*, බදු සහ සහනාධාර මඟින් රජය මිල කෙරෙහි බලපෑම් ඇති කරනු ලබන අතර, එයින් සෘජුව සහ වක්‍රව මිල යාන්ත්‍රණයේ මෙහෙයුම් කෙරෙහි බලපෑම් ඇතිකරනු ලැබේ.

**1.17** …………………… *(පූර්ණ තරගය / ඒකාධිකාරී තරගය)* මඟින් ප්‍රභේදනයක් සහිත (Differentiated) භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබයි.

**1.18** බැහැර කිරීමේ නොහැකියාව (Non excludability) සහ පරිභෝජනයේදී තරඟකාරීත්වයක් නොවීම (non-rivalry) මඟින් …………………… *[පොදු භාණ්ඩවල (public goods) / සුබසාධන භාණ්ඩවල (merit goods)]* වැදගත්කම පෙන්නුම් කෙරේ.

**1.19** විදේශ විනිමය සඳහා පවතින ඉල්ලුම සහ සැපයුම මත පදනම්ව තීරණය වන විනිමය අනුපාතිකය හඳුන්වනු ලබන්නේ …………………… *(ස්ථාවර / පාවෙන)* විනිමය අනුපාතිකය ලෙසයි.

**1.20** තැන්පත්කරුවන්ගෙන් අරමුදල් එකතු කර ණය ලබා ගන්නන්ට ඒවා ණයට දීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ …………………… *[මූල්‍ය අන්තර්ගතකරණය (Financial inclusion) / මූල්‍ය අතරමැදිකරණය (Financial intermediation)]* ලෙසයි. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(a) භාණ්ඩයක් සඳහා, පහත සඳහන් ඉල්ලුම් (Qd) සහ සැපයුම් (Qs) සමීකරණ ඔබ වෙත දී ඇත:

$$Qd = 200 - 2P$$

$$Qs = -40 + 6P$$

(i) භාණ්ඩයේ සමතුලිත මිල **ගණනය කරන්න**. (ලකුණු 02)

(ii) භාණ්ඩයේ සමතුලිත ප්‍රමාණය **ගණනය කරන්න**. (ලකුණු 02)

(iii) අනෙකුත් දේවල් ස්ථාවරව තිබියදී, ඉහත භාණ්ඩය සඳහා, පැවති පාරිභෝගික රුචිය එයින් බැහැර වී ඇත්නම්, එමගින් ඉහත ගණනය කළ සමතුලිත මිල සහ ප්‍රමාණය කෙරෙහි වන බලපෑම **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරනු ලබන සාධක තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

(a) ආයතනයක් වසා දමන ලක්ෂ්‍යය (shutdown point) සහ සමච්ඡේදන ලක්ෂ්‍යය (break-even point) අතර වෙනස ප්‍රස්තාරයක් ආධාරයෙන්, **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) (i) වාණිජ බැංකුවක කාර්යයන් තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී (licensed) වාණිජ බැංකු සඳහා උදාහරණ දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 01)

(මුළු ලකුණු 10)

### 04 වන ප්‍රශ්නය

(a) මුදලට ඇති ඉල්ලුම වැඩිවීමකදී සමතුලිත පොලී අනුපාතිකය කෙරෙහි ඇතිවන බලපෑම ප්‍රස්තාරයක් ආධාරයෙන්, **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) ඉල්ලුමෙන් ඇදුනු උද්ධමනය (Demand Pull Inflation) සහ පිරිවැයෙන් තල්ලුවුනු උද්ධමනය (Cost Push Inflation) අතර වෙනස **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

### 05 වන ප්‍රශ්නය

(a) මුදල් සැපයුම කළමනාකරණය කිරීමේදී, විවෘත/විවට වෙළෙඳ කටයුතු (open market operations), ප්‍රමාණාත්මක පාලනයක් ලෙස ක්‍රියාකරන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(b) ආරක්ෂණවාදයේ (protectionism) අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(c) ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල මෑතකදී අවප්‍රමාණය වීමට ප්‍රධාන හේතු දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

(A) (a) රාජ්‍ය ව්‍යවසායයන්හි අවාසි දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) රාජ්‍ය අයවැයේ ප්‍රධාන අරමුණු හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(B) වර්ෂයක කාලච්ඡේදයක් සඳහා කල්පිත ආර්ථිකයක ජාතික ගිණුම්වලට අදාල පහත සඳහන් තොරතුරු ඔබ වෙත දී ඇත:

| | **රු. මිලියන** |
|---|---|
| සේවක ආදායම (compensation for employees) | 2,000 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1,000 |
| මිශ්‍ර ආදායම | 1,100 |
| නිෂ්පාදන සහ ආනයන මත ශුද්ධ බදු | 750 |
| විදේශීය ශුද්ධ වර්තන (ජංගම) සංක්‍රාම (transfers) | 550 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | 1,200 |
| ශුද්ධ වක්‍ර බදු | 150 |

ඉහත තොරතුරු භාවිත කරමින්,

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **ගණනය කරන්න**:

(a) මූලික මිල අනුව දළ (සමස්ත) එකතුකළ අගය [Gross Value Added (GVA)]. (ලකුණු 04)

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය [Gross Domestic Product (GDP)]. (ලකුණු 02)

(c) දළ ජාතික ආදායම [Gross National Income (GNI)]. (ලකුණු 02)

(d) වැයකළ හැකි දළ ජාතික ආදායම [Gross National Disposable Income (GNDI)]. (ලකුණු 02)

(C) පහත දැක්වෙන පද දෙක **පැහැදිලි කරන්න**:

(a) ආර්ථික වර්ධනය. (ලකුණු 02)

(b) ආර්ථික සංවර්ධනය. (ලකුණු 02)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාල කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |